# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 11/2014**

නො. 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07
2014, ඔක්තෝබර් මස 23 වන දින.

උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**<u>පෞද්ගලික සහකාරවරුන්/ ලේඛණාගාර භාර පොත් බඳින්නන්/ කාර්යාල යන්ත්‍ර ක්‍රියාකරවන්නන්/ ලසුලේඛකවරුන් සඳහා ගෙවීම් කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් 1996.09.02 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 687 හා 2002.11.14 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 813 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

2014.08.18 දින රැස්වූ 902 වන කොමිෂන් සභා වාරයේදී පහත වගුවෙහි නිරූපිත තනතුරු සඳහා වන ගෙවීම් 2014.10.01 දින සිට සංශෝධනය කිරීමට තීරණය කරන ලදී.

| | විස්තරය | ගාස්තුව (රු.) |
|---|---|---|
| i. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති/ ලේකම් සහ විශ්වවිද්‍යාලවල උපකුලපති/ නියෝජ්‍ය උපකුලපති/ ලේඛකාධිකාරී සහ ආයතන අධ්‍යක්ෂවරුන්ගේ පෞද්ගලික සහකාරවරුන් සඳහා. | 1000.00 මාසිකව |
| ii. | කොමිෂන් සභා රැස්වීම්, පාලන සභා රැස්වීම්/ ආයතන හා උසස් අධ්‍යාපන ආයතන වල කළමනාකරණ කමිටු රැස්වීම් වල වාර්තා සටහන් කිරීම වෙනුවෙන් ලසුලේඛකවරුන් සඳහා. | රැස්වීම් වාරයක් සඳහා 300.00 |
| iii. | උපකුලපතිවරුන් හා අධ්‍යක්ෂවරුන්ගේ කමිටුව/ විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ථාවර කමිටු/ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් පිළිගත් අනෙකුත් ව්‍යවස්ථාපිත කමිටු සහ යාවත් කාර්ය (Ad- hoc) කමිටු, කොමිෂන් සභාව හෝ පාලක බලමණ්ඩලය විසින් පත්කරනු ලැබූ කමිටු රැස්වීම් වල වාර්තා සටහන් කිරීම වෙනුවෙන් ලසුලේඛකවරුන් සඳහා. | රැස්වීම් වාරයක් සඳහා 200.00 |
| iv. | සාමාන්‍ය රාජකාරි කටයුතු වලට අමතරව ලේඛණාගාර භාර පොත් බඳින්නන් ලෙස පත්කර ඇති සුළු සේවකයින් සඳහා . | 300.00 මාසිකව |
| v | සාමාන්‍ය රාජකාරි කටයුතු වලට අමතරව කාර්යාල යන්ත්‍ර ක්‍රියාකරවන සුළු සේවකයින් සඳහා. | 350.00 මාසිකව |

1996.09.02 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 687 හා 2002.11.14 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 813 හි ප්‍රතිපාදන මෙමගින් අවලංගු කෙරේ.

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ/කළේ: මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම
සභාපතිනිය

පිටපත්:

1. ලේකම්/ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති කාර්යාලය
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින්
5. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල වල ලේඛකාධිකාරිවරුන්
8. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගණකාධිකාරී
9. විශ්වවිද්‍යාල වල මුල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන වල පුස්තකාලයාධිපතිවරුන්/ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන්/ජ්‍යෙ.ස.ලේ /ස.ලේ
12. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය මුල්‍යාධිකාරීවරුන්/ජ්‍යෙ.ස.මු/ස.මු
13. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක
14. විශ්වවිද්‍යාල වල රජයේ විගණන අධිකාරිවරුන්
15. උසස් අධ්‍යාපන ආයතන වල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්/ ස.අ.වි
16. වෘත්තීය සමිතිවල ලේකම්වරුන්
17. විගණකාධිපති

ගොනු අංකය: යූ.ජී.සී./එච්.ආර්./6/1/3